(1) සාලියගේ ව්‍යාපාරයෙහි 2002 මාර්තු 31 දිනට මුදල් පොතෙහි දැක්වුනු බැංකු ශේෂය රු. 25,000 ක් විය. නමුත් මාර්තු මාසය සඳහා ලද බැංකු ප්‍රකාශයෙහි ශේෂය ඊට වෙනස් විය.

ඒ සඳහා බලපෑ හේතු පහත පරිදිය.

(i) තැන්පත් කල එහෙත් නිෂ්කාශණය නොවූ චෙක්පත් රු. 2,500 යි.
(ii) නිකුත් කල එහෙත් බැංකුවට ඉදිරිපත් කර නොතිබුණ චෙක්පත් රු. 1,000 යි.
(iii) මුදල් පොතේ සටහන් නොවූ නිත්‍ය නියෝග මත බැංකුව ගෙවා තිබූ රක්ෂණ වාරිකය රු. 1,500 යි.
(iv) බැංකුව ප්‍රකාශයේ තිබූ එහෙත් මුදල් පොතේ සටහන් කර නොතිබුණ බැංකු ගාස්තුව රු. 500 යි.
බැංකු විස්තරයට අනුව 2002 මාර්තු 31 දින ශේෂය සොයන්න.

(2) ජනතාවගේ ව්‍යාපාරයෙහි 2002 මැයි 31 දිනට අදාලව මුදල් පොතෙහි බැංකු ශේෂය, බැංකු විස්තරයෙහි දැක්වෙන ශේෂයෙන් වෙනස් විය. එදින බැංකු විස්තරයට අනුව ශේෂය රු. 30,000 කි. වෙනසට බලපෑ හේතුන් පහත පරිදිය.
(i) තැන්පත් කල එහෙත් නිෂ්කාශණය (උපලබ්ධි) නොවූ චෙක්පත් රු. 500 යි.
(ii) නිකුත් කල එහෙත් ඉදිරිපත් නොකල චෙක්පත් රු. 2000 යි.
(iii) ණයගැතියන් සෘජුවම බැංකුවට එවා තිබූ මුදල් රු. 3000 මුදල් පොතෙහි සටහන් වී නොමැත.
(iv) මුදල් පොතේ සටහන් නොවූ බැංකු ගාස්තු රු. 500 යි.
(v) තැන්පත් කිරීමෙන් පසු අගුරු වී ඇති එහෙත් අගරුව පිළිබඳ මුදල් පොතෙහි සටහන් කර නොමැති චෙක්පත් වල වටිනාකම රු. 1,500 යි.

(3) සීමිත රාජ් සමාගමේ ගණකාධිකාරිවරයා සමාගමේ මුදල් හා බැංකු ගණුදෙනු පිළිබඳව පහත සඳහන් තොරතුරු ඔබට ඉදිරිපත් කොට ඇත.
(i) 2004 පෙබරවාරි 28 දිනට මුදල් පොත අනුව මුදල් ශේෂය රු. 11 200 ක් වූ අතර බැංකු ශේෂය රු. 46 700 ක් විය.
(ii) මුදල් පොත අනුව 2004 මාර්තු මාසය තුළදී
ගණුදෙනුකරුවන්ගෙන් ලැබූ චෙක්පත් හා මුදල් රු. 447 500
මුදලින් කළ ගෙවීම් රු 185 700
චෙක්පත් මගින් කළ ගෙවීම් (සැපයුම්කරුවන්ට හා වියදම් සඳහා) රු. 210 900
බැංකුවේ තැන්පත් කළ මුදල් රු. 198 000
බැංකුවේ තැන්පත් කළ චෙක්පත් රු. 105 000
බැංකුවෙන් මුදල් කළ සමාගමේම චෙක්පත් රු. 50 000
අධ්‍යක්‍ෂකවරු මුදල් භාරකරුට තම පුද්ගලික චෙක්පත් දී ලබාගත් මුදල් රු. 48 000
(iii) 2004 මාර්තු මාසය සඳහා බැංකුව එවූ මාසික ප්‍රකාශනයේ දැක්වෙන පහත සඳහන් කරුණු මුදල් පොතේ සටහන්ව නැත.
බැංකුව බැර කර ඇති බැංකු ණය රු. 130 000
බැංකුවට කෙලින්ම ලැබී ඇති ලාභාංශ රු. 14 400
බැංකුව අයකොට ඇති ණය පොලී රු. 2 400
ස්ථාවර නියෝග යටතේ බැංකුව ගෙවා ඇති රක්‍ෂණ වාරික රු. 1 800
(iv) 2004 පෙබරවාරි 28 දිනට තැන්පත් කොට ඇතිමුත් උපලබ්ධි නොවූ චෙක්පත්වල වටිනාකම රු. 34 500 ක් වූ අතර එවා 2004 මාර්තු 31 දිනට රු. 46 850 දක්වා වැඩිවී තිබුණි.
(v) 2004 පෙබරවාරි 28 දිනට සැපයුම්කරුවන්ට හා නොයෙකුත් වියදම් සඳහා නිකුත්කොට ඇතිමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කොට නොතිබුණු චෙක්පත්වල අගය රු. 61 550 ක් වූ නමුත් එවා 2004 මාර්තු 31 දිනට රු. 28 650 ක් විය.
(vi) 2004 මාර්තු මාසයේදී බැංකුව ආපසු එවා ඇති රු. 5000 ක අගරු වූ චෙක්පත පිළිබඳව මුදල් පොතේ සටහන් තබා නොමැත.
ඉහත සඳහන් තොරතුරු නිසි පරිදි උපයෝගී කරගෙන පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

(අ) මාසය ආරම්භයේ හා අවසානයේ ශේෂයන් දක්වමින් 2004 මාර්තු මාසය සඳහා මුදල් හා බැංකු තීරු 2 දක්වමින්, සමාගමේ පොත් තබන්නා දැනට පිළියෙල කර ඇති මුදල් පොත.

(ආ) මාසය ආරම්භයේ හා අවසානයේ ශේෂයන් දක්වමින් 2004 මාර්තු මාසය සඳහා බැංකුව එවා ඇති මාසික ප්‍රකාශනය.

(ඇ) 2004 මාර්තු 31 දිනට දැනට මුදල් පොතේ දැක්වෙන ශේෂය උපයෝගී කරගනිමින් බැංකු සැසඳුම් ප්‍රකාශය.

(4) පහත කරුණු ඇසුරු කරගෙන, සීමාසහිත ධනපාල සමාගමේ, 1994.12.31 දිනට බැංකු සැසඳුම් විස්තරයක් සකස් කරන්න.

(i) බැංකු ප්‍රකාශණයේ දැක්වෙන පරිදි අයිරාව රු. 18,560 කි.

(ii) දෙසැම්බර් අවසාන සතියේ ණය හිමියන්ට නිකුත් කරන ලද රු. 3,700 ක, රු. 6,500 ක, රු. 370 ක චෙක්පත් බැංකු ප්‍රකාශනයේ දක්නට නැත.

(iii) රු. 7,500 ක ලැබුණු චෙක්පත් මුදල් පොතේ බැංකු තීරුවේ වාර්තාගත කර ඇතත් දෙසැම්බර් මාසය තුළදී බැංකුවේ තැන්පත් කර නොමැත.

(iv) රු. 70 ක් බැංකු ගාස්තු සහ බැංකුව අයකල රු. 1,800 ක ණය පොළිය මුදල් පොතේ සටහන් වී නැත.

(v) බැංකුව විසින් රැස්කල රු. 2,850 ක ලාභාංශ ආදායම මුදල් පොතේ සටහන් වී නැත.

(vi) දෙසැම්බර් 20 වැනි දින බැංකුවේ තැන්පත් කරන ලද රු. 90 ක චෙක්පත් බැංකු ප්‍රකාශයේ දැක්වෙන අතර, මුදල් පොතේ සටහන් වී නැත.

(vii) දෙසැම්බර් 27 වැනි දින රු. 2,400 ක, සහ රු. 2,100 ක චෙක්පත් බැංකුවේ තැන්පත් කරන ලද නමුත්, උපලබ්ධි වී ඇත්තේ, 1995 ජනවාරි 10 දිනයි.

(5) පහත සඳහන් වන්නේ, සිරිමල් සමාගමේ 2002 ජනවාරි මස මුදල් පොත, බැංකු විස්තරය සහ 2001 දෙසැම්බර් බැංකු සැසඳුම් ප්‍රකාශණයයි.

**2001 දෙසැම්බර් බැංකු සැසඳුම් ප්‍රකාශය**

| | | |
|---|---|---|
| මුදල් පොතට අනුව බැංකු ශේෂය | | 21,000 |
| එකතු කලා | | |
| නිකුත් කල නමුත්, ඉදිරිපත් නොවූ චෙක්පත් - 081 | 6,000 | |
| 083 | 4,000 | 10,000 |
| | | 31,000 |
| අඩුකලා | | |
| බැංකුව බැර නොකල තැන්පතු - චෙක් තැන්පතු | 8,100 | |
| - චෙක් තැන්පතු | 1,7000 | (9,800) |
| බැංකු විස්තරයට අනුව බැංකු ශේෂය | | 21,200 |

**2002 මුදල් පොත (බැංකු තීරුව) 2002 ජනවාරි**

| | | | | |
|---|---|---|---|---|
| ජන : 01 ශේෂය | 21,000 | ජන : 03 චෙක්පත් | 085 | 2,000 |
| ජන : 10 මුදල් තැන්පතු | 8,000 | ජන : 12 චෙක්පත් | 086 | 4,000 |
| ජන : 14 චෙක් තැන්පතු | 6,000 | ජන : 16 චෙක්පත් | 088 | 3,000 |
| ජන : 18 චෙක් තැන්පතු | 5,000 | ජන : 21 චෙක්පත් | 089 | 5,000 |
| ජන : 23 චෙක් තැන්පතු | 4,000 | ජන : 31 චෙක්පත් | 090 | 1,000 |
| | | ජන : 31 ශේෂය ප.ගෙ | | 29,000 |
| ජන : 31 මුදල් ඉ.ගෙ | 44,000 | | | 44,000 |
| | 29,000 | | | |

**බැංකු විස්තරය (2002 ජනවාරි)**

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| ජන : 01 | ශේෂය | | | 21,200 |
| ජන : 05 | චෙක්පත් - 085 | 2,000 | | 19,200 |
| ජන : 06 | චෙක්පත් තැන්පතු | | 8,100 | 27,300 |
| ජන : 10 | චෙක්පත් - 081 | 6,000 | | 21,300 |
| ජන : 10 | මුදල් තැන්පතු | | 8,000 | 29,300 |
| ජන : 16 | විදුලිය වියදම් | 1,300 | | 28,000 |
| ජන : 20 | චෙක්පත් තැන්පතු | | 5,000 | 33,000 |
| ජන : 26 | චෙක්පත් - 089 | 5,000 | | 28,000 |
| ජන : 28 | ලාභාංශ ආදායම | | 3,300 | 31,300 |
| ජන : 30 | බැංකු ගාස්තු | 200 | | 31,100 |

ඔබ විසින් මුදල් පොත ගලපා බැංකු සැසඳුම් ප්‍රකාශය සකසන්න.

06. දාස ව්‍යාපාරයේ, 2001 දෙසැම්බර් මස බැංකු ශේෂයන් පහත සඳහන් පරිදි විය.

මුදල් පොතට අනුව බැංකු ශේෂය රු. 53,400

බැංකු විස්තරය අනුව බැංකු ශේෂය රු. 32,600

ශේෂයන් අසමාන වීමට බලපාන ලද සොයා ගත් කරුණු පහත දැක්වේ.

(ස) බැංකුව අයකල රු. 250 ක බැංකු ගාස්තු මුදල් පොතේ නොවිය.

:සස-නිකුත් කල නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 15,200 කි.

:සසස- ස්ථාවර නියෝග රු. 8,000 ක් මුදල් පොතේ සටහන් වී නොමැත.

:සඩ- බැංකුව විසින් ගෙවා අඩුකල රු. 425 ක රක්ෂණ ගාස්තු මුදල් පොතේ නොවිය.

:ඩ- ණයගැතියන් කෙලින්ම බැංකුවේ තැන්පත් කල රු. 1200 ක තැන්පතු මුදල් පොතේ සටහන් වී නොමැත.

**ඔබ විසින්**

සියළු කරුණු ඇතුලත් වන පරිදි බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කොට, තැන්පත් කල නමුත්, බැංකුව විසින් මෙතෙක් බැර නොකල තැන්පතු වල වටිනාකම සොයන්න.

(07) 2001 දෙසැම්බර් 31 දිනට ' සමාගමේ බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශයේ සාරාංශය පහත දැක්වේ.

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දෙසැම්බර් 01 ශේෂය | | 29,300 |
| මුදල් තැන්පතු | | 81,000 |
| චෙක් තැන්පතු | | 145,000 |
| ගෙවූ චෙක්පත් | 182,000 | |
| ලාභාංශ ආදායම් | | 12,000 |
| ණය වාරික පොලී | 10,000 | |
| ගිනි රක්ෂණ ගාස්තු | 5,000 | |
| දෙසැම්බර් 31 ශේෂය | 70,300 | |
| | 267,300 | 267,300 |

පහත කරුණු සපයා ඇත.

1. 2001 දෙසැම්බර් 31 දිනට තිබූ ඉදිරිපත් නොවූ චෙක්පත් සහ බැර නොකල චෙක්පත් පිළිබඳ විස්තරය පහත දැක්වේ.

| | 12.01 දිනට තිබූ ප්‍රමාණය | දෙසැම්බර් මාසයේ ඉදිරිපත් වූ ප්‍රමාණය | 12/31 දිනට ඇති ඉතිරිය |
|---|---|---|---|
| බැර නොකල චෙක්පත් | 41,000 | 16,000 | 25,000 |
| ඉදිරිපත් නොවූ චෙක්පත් | 32,000 | 18,500 | 13,500 |

2. බැංකු ප්‍රකාශය ලැබෙන තුරු ස්ථාවර නියෝග ගණුදෙනු කිසිවක් මුදල් පොතට ගෙන නොතිබුණි.
3. 2001 දෙසැම්බර් මාසය තුලදී නිකුත් කල චෙක්පත් වලින් රු. 24,400 ක චෙක්පත් දෙසැම්බර් අවසාන වන තුරු බැංකුව වෙත ඉදිරිපත් කර තිබුණේ නැත.
4. 2001 දෙසැම්බර් මාසය තුලදී බැංකුවේ තැන්පත් කල චෙක් තැන්පතු වලින් රු. 41,800 ක චෙක්පත් බැංකුව විසින් දෙසැම්බර් අවසාන වනතුරු බැරකර නොමැත.

**ඔබ විසින්**

අ. 2001 නොවැම්බර් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කොට මුදල් පොතට අනුව නොවැම්බර් 30 දිනට තිබූ බැංකු ශේෂය සොයන්න.

ආ. 2001 දෙසැම්බර් මාසයේ මුදල් පොතට අනුව
ස නිකුත් කල චෙක්පත් වල අගය
සසතැන්පත් කල චෙක්පත් වල අගය සොයන්න.

ඇ. 2001 දෙසැම්බර් බැංකු ප්‍රකාශය ලැබීමට පෙර මුදල් පොත පෙන්වා එය සංශෝධනය කර පෙන්වන්න.

ඈ. 2001 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පෙන්වන්න.